සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 09 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper I | පැය / மணித்தியாலம் / Hours 02 |

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**
- **අංක 01 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරැදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න**

---

1) පුරාණ ගිවිසුමේ පළමුවන පොත් පහ හැඳින්වෙන්නේ …………………… යනුවෙනි

1. පංච පුස්තකය 2 හිතෝපදේශය 3 රාජාවලිය 4 ප්‍රඥාව

2) ඉශ්‍රායලේ හී ප්‍රධාන දිවැසිවරුන් නමින් ඇති දිවැසි ග්‍රන්ථ 03 දැක්වෙන පිළිතුරු කාණ්ඩය වනුයේ

1. ජෝනා, මීකා, නාහුම් ය
2. යෙසායා, ජෙරමියා, එසකියෙල් ය
3. සෙකරියා, හග්ගායි, මලාකිය
4. ජෙරමියා, මීකා, යෙසායාය

3) මුල් කිතුනු සභාව ආරම්භ වී වර්ධනය වු ආකාරය සඳහන් වන්නේ ……………………….. පොතෙහිය

1. ජොහන් ශුභාරංචිය 2. ගීතාවලිය 3. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා 4. වංශාවලිය

4) පුරාණ ගිවිසුමේ ඉතිහාස පොත් කාණ්ඩයේ පළමුවන පොත වන්නේ

1. වීරාවලිය 2. එස්රාය 3. සාමුවෙල්ය 4. ජෝෂුවාය

5) සංදේශ අතර පළමුව සඳහන් සංදේශය වන්නේ

1. රෝම 2. පිලිප්පි 3. ගලාති 4. එපීස

6) යාච්ඤාමය ගීතිකා 150කින් යුත් ශුද්ධ බයිබලය ග්‍රන්ථය ……………………. ය

1. ධර්මදේශක 2. ගීතාවලිය 3. විලාප ගී 4. ප්‍රේම ගී

7) නව ගිවිසුමේ සංදේශ දහ තුනක්ම ලියා ඇති ලේඛකයා වනුයේ

1. ශුද්ධ වු ලූක් තුමාය
2. ශුද්ධ වු ජාකොබ් තුමාය
3. ශුද්ධ වු පාවුලු තුමාය
4. ශුද්ධ වු පේදුරු තුමාය

8) රෝමයේ නීරෝ අධිරාජ්‍යයාගේ පීඩනයට ලක්වු කිතුනුවන් දිරිමත් කිරීම අරමුණු කරගත් ශුභාරංචිය වනුයේ

1. මතෙව් ශුභාරංචිය 2. ලූක් ශුභාරංචිය 3. ජොහන් ශුභාරංචිය 4. මාක් ශුභාරංචිය

9) ජෙරුසලම කරා යන වන්දනා ගමන් වල දී භාවිතා කර ඇත්තේ

1. සියොන් ගීතිකා ය 2. රාජකීය ගීතිකාය 3. ප්‍රඥා ගීතිකාය 4. විශ්වාසයේ ගීතිකාය

10) සංදේශ වල ඇතුළත් ඉතාමත් වටිනා දහම් පණිවුඩයන් අපට ලැබෙන මහඟු අවස්ථාවක් වන්නේ

1. ඉරු දින දහම් පාසල
2. ඉරු දින දිව්‍ය පූජාව
3. අසිපා වැඩසටහන්
4. සන්ධ්‍යා මෙහෙයයන්

11) A අන්තිම රාත්‍රි භෝජනයේ දී
B කන්ද උඩ දේශනාවේ දී
C කුරුස ගසේ දී
D අන්‍ය රූප විලාස වීමේ දී
ඉහත අක්ෂර වලින් දැක්වෙන අවස්ථා අධ්‍යයනය කරන්න
ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම් වල දී ගීතාවලියෙහි ගීතිකා භාවිතා කර ඇති බවට නිදසුන් දෙකක් වනුයේ

1. A සහ B ය 2. C සහ D ය 3. B සහ C ය 4. A සහ D ය

12) ''ඔබ මාගේ ප්‍රියාදර …………………. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි'' යි. අහසින් හඬක් නික්මිණි. (ලූක් 3 : 22)
මෙම ශුද්ධ ලියවිලි පාඨය සම්පූර්ණ කිරීමට වඩාත් සුදුසු පදය වන්නේ

1. සමිඳාණෝය 2. පියාණෝය 3. දෙවිඳාණෝය 4. පුත්‍රයාණෝය

13)




නව ගිවිසුමේ පොත් වර්ගීකරණය ඉහත රූප සටහනින් දැක්වේ. මෙහි හිස්තැනට අදාළ පිළිතුර වන්නේ

1. එළිදරව් සාහිත්‍යය 2. පෙරදිග සාහිත්‍යය 3. පුරාණ සාහිත්‍යය 4. ප්‍රඥා සාහිත්‍යය

14 ''දෙවිඳුනි රජතුමාට ඔබගේ විනිශ්චය කිරීමේ ඥානය දුන මැනව'' (ගීතාවලිය 72 :1)
මෙම ශුද්ධ ලියවිලි පාඨය අනුව, ජනතාව නිවරැදි ලෙස විනිශ්චය කිරීමේ ඥානය ඉල්ලා දෙවිඳුන්ට යාච්ඤා කලේ ………………………… රජතුමාය.

1. සාවුල් ය 2. සලමොන් ය 3. දාවිත් 4. ආහබ්

15 අපගේ ජීවිත සාර්ථක ලෙස ඵල දැරීමට …………………………. නැමැති මිදි වැලට සම්බන්ධ විය යුතු වෙමු

1. පියාණන් වහන්සේ 2. ශුද්ධාත්මයාණන් වහන්සේ
3. ජේසුස් වහන්සේ 4. පරමෝත්තමයාණන් වහන්සේ

16 A ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බව
B උන්වහන්සේ අදහා ගැනීමෙන් සදාතන ජීවිතය ලැබෙන බව
C ජේසුස් වහන්සේ විශ්වීය ගැළවුම්කරුවාණන් බව
D ජේසුස් වහන්සේ නව මෝසෙස් තුමා හා නව මෙසියානික ගුරුවරයාණන් බව

ඉහත දැක්වෙන කරුණු අනුව ශුද්ධ වූ ජොහාන් තුමාගේ ශුභාරංචියේ අරමුණු දෙකක් වනුයේ

1. A සහ C ය 2. B සහ C ය 3. C සහ D ය 4. A සහ Bය

17 ''සියොන්'' යනුවෙන් හැඳින්වෙන්නේ …………………… ය

1. ජෙරුසලම 2. බෙත්ලෙහෙම 3. ජෙරිකෝව 4. බෙතනිය

18 A හොඳම මිතුරාට හෝ මිතුරියට ඒ ගැන පැවසීම

B නපුරේ බලවේග පිළිබඳ දැනුවත් වීම

C අපගේ හෘද සාක්ෂියට සවන් දී එයට අවනත වීම

D දුර්පරීක්ෂාවට හසු නොවන ලෙස යාච්ඤා කිරීම

දුර්පරීක්ෂාවක් පැමිණි විට අප ගත යුතු වඩාත් සුදුසු ක්‍රියාමාර්ගය වන්නේ ඉහත පිළිතුරු අතුරින්

1. A සහ B ය 2. C සහ B ය 3. B සහ D ය 4. A සහ Cය

19 ''තා සහ ස්ත්‍රිය අතර ද තගේ වංශය සහ ඇගේ වංශය අතර ද බද්ධ වෛරය තබන්නෙමි.'' ඔහු තගේ හිස පොඩි කරන්නේ ය'' මෙම වගන්තියෙහි ඔහු යනුවෙන් අදහස් කරන්නේ

1. ස්නාවක ජොහන් තුමාය
2. මානව වංශයය
3. ජේසුස් ස්වාමීන් වහන්සේය
4. මරිය තුමියය

20 සමදර්ශක ශුභාරංචි කතුවරුන් තිදෙනාම සමාන ආකාරයකට දකින ජේසුස් වහන්සේගේ ජීවිත සිදුවීමක් වනුයේ

1. ජේසුස් වහන්සේගේ උපත
2. වතුර මිදි යුෂට හැරවීම
3. ලාසරස් මරණින් නැගිටුවීම
4. ජේසුස් වහන්සේගේ බව්තිස්මය

## II කොටස

- **පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 16ක් ද, තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමි වේ.**

1) ''ශුද්ධ බයිබලය'' යන මාතෘකාව යටතේ ඔබ විසින් කරන ලද ක්‍රියාකාරකම ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1 ශුද්ධ බයිබලය බෙදෙන ප්‍රධාන කොටස් 02 නම් කරන්න (ල 03)

2. දේව වචනයට සවන් දීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 02ක් ලියන්න (ල 04)

3. නව ගිවිසුමේ අවසාන පොත නම් කරන්න (ල 02)

4. පුරාණ ගිවිසුමේ සඳහන් ආදි පියවරුන් දෙදෙනෙකු නම් කරන්න (ල 03)

5. ශුද්ධ බයිබලයට ගෞරවය දැක්වීමට ඔබ කරන යෝජනා 02ක් ලියන්න (ල 04)

2)

1 .''ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමට සහ නව ගිවිසුමට අයත් පොත් සංඛ්‍යාව ලියන්න

2 පුරාණ ගිවිසුමේ පළමුවන පොත් කාණ්ඩයට ඇතුළත් පොත් තුනක් නම් කරන්න

3 ඔබ තුළ ඇති දේව විශ්වාසය වර්ධනය කර ගැනීමට ගත හැකි පියවර 05ක් ලියා දක්වන්න

3)

1 මතෙව් ශුභාරංචිය හැඳින්වෙන වෙනත් නම් දෙකක් ලියන්න

2 ශුද්ධ වූ පාවුලු තුමා විසින් ලියන ලද සංදේශ 03 නම් ලියන්න

3 ''දේව වචනය කියවීම හා මෙනෙහි කිරීම යහපත් කිතුනු ගුණාංගයකි'' මෙම අදහස පේළි 06කින් විස්තර කරන්න

4)

1 ගීතාවලිය හඳුන්වනු ලබන වෙනත් නම් දෙකක් ලියන්න

2 ගීතාවලියෙහි ගීත වර්ගීකරණයේ කොටස් 03ක් නම් කරන්න

3 ඔබට දෙවිඳුන්ගෙන් ලැබී ඇති වරප්‍රසාද හෝ දීමනා වෙනුවෙන් තුති පිදීමට යැදුමක් නිර්මාණය කරන්න

5)

1 ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරුන් වන ශුභාරංචි කතුවරුන් දෙදෙනා නම් කරන්න

2 සමදර්ශන ශුභාරංචි 03 පිළිවෙලින් ලියා දක්වන්න

3 දේව රාජ්‍යය පතළ කිරීමට අප සතු ලේඛන හැකියා යොදා ගත හැකි ආකාරය වගන්ති 06කින් විස්තර කරන්න

6)

1 ශුද්ධ වූ ජොහන් තුමාගේ ශුභාරංචියේ සඳහන් ''මම වෙමි'' ප්‍රකාශ 02ක් ලියන්න

2 ජේසුස් වහන්සේගේ සැබෑ ශ්‍රාවකයෙක් වීමට ඔබට කළ හැකි කාර්යයන් 03ක් ලියා දක්වන්න

3 යහපත් එඩේරාගේ වසර'' ලෙස නම් කර ඇති මෙම වසර තුළ ආධ්‍යාත්මික ජීවිතය වර්ධනය කර ගැනීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග 06ක් විස්තර කරන්න

7)

1 ඒදන් උයනෙහි පදිංචි කරවූ ආදම් සහ ඒව ට දෙවියන් වහන්සේ දුන් අවවාදය කුමක් ද?

2 පාපයෙහි ප්‍රතිඵල වශයෙන් ආදම්ට ලැබුණු දඬුවම් 03 ක් ලියන්න

3 දේව හඬට සවන් නොදී වැරදි මගට යොමුවූ මිතුරෙකුට හෝ මිතුරියකට යහමඟ පෙන්වීමට ඔබට කල හැකි කාර්යයන් 06ක් විස්තර කරන්න